**35 වන පිටෙන්**




අප වෙත දැනුම් දී තිබුණි.

කොට්ඨාශ මට්ටමින් සිදු කළ වැඩ කටයුතු අතර සමහර කටයුතු සටන්කාමී කාන්තාවන් සඳහාම පමණක් විය. එය අතහැර සංවිධානය විසින් ජනතාව අතරෙහි පොදුවේ සිදුකරනු ලබන වැඩ කටයුතුවලට සටන්කාමී සහෝදරියන්ට ද වගකීම් පැවරිය යුතුය යනුවෙන් හඬ නැඟූ බොහෝ සටන්කාමී සහෝදරියන්ගේ විරෝධයන්ට සහ ගැටුම්වලට මුහුණ දීමට සිදුවිය.

දේශපාලන අංශයේ සටන්කාමී සාමාජික සාමාජිකාවන් සඳහා දේශපාලන පුහුණු විදුහල් ඉරුපාලරෙ ප්‍රදේශයෙහි පිහිටුවා තිබුණි. සියලු දෙනා එකට රැස්කර එහි පන්ති පැවැත්වීම සාමාන්‍යයෙන් සිදුවිය. සංවිධානයෙහි ජ්‍යෙෂ්ඨ සාමාජිකයන් සහ ප්‍රමුඛ පෙළේ නායකයන් විසින් දේශපාලන පන්ති පවත්වන ලදි. කථික පුහුණු තරඟ, විවාද මණ්ඩප සහ සාමාන්‍ය දැනීමේ පරීක්ෂණ පැවැත්වෙයි. මෙවැනි අවස්ථා සංවිධානයෙහි සාමාජිකයන් තුළ බුද්ධිය වර්ධනය කිරීමටද ඔවුන්ගේ දක්ෂතා හඳුනාගැනීමට ද අවස්ථාවක් සැපයුවේය. අලුතින් 'අධ්‍යාපන කණ්ඩායම' පිහිටුවීම සඳහා සටන්කාමීන්ව තෝරා ගැනීම සිදුවිය. එයට ස්ත්‍රී පුරුෂ යන දෙපාර්ශ්වයෙන්ම ඇතුළත් වන ලෙස දස දෙනෙකුව තෝරා ගැනිණ. අධ්‍යාපන කණ්ඩායමට අයත්වන සෑම සාමාජිකයෙක්ම වගකීම් භාර නිලධාරියෙකුගේ සුදුසුකම් සහිතව සිටිය යුතුය යන අරමුණින් දේශපාලන අංශයේ වගකීම් භාර තමිල් චෙල්වන් විසින් අදාළ සාමාජිකයන්ව තෝරා ගන්නා ලදි. සටන්වලදී බළඇණි මෙහෙයවා අත්දැකීම් ඇති අයද, ජනතාව අතරේ දේශපාලන වැඩ කටයුතුවල යෙදුණු අය ද තෝරා ගැනීමට ලක්විය. එම කණ්ඩායමට මාව ද තෝරා ගත්තේය. සංවිධානය කුමන රාජකාරිය පැවරුවත් ඇඳුම් බෑගයක් රැගෙන වහාම පිටත්වීමට සූදානමින් සටන්කාමියෝ උන්හ. මම ද එසේ කළෙමි.

කාලය ගත වුණේ නතර වී හුස්මක් ගෙන සිතීමට ඉඩක් නොතබාය. ඉතාමත් දැඩි ආයතනයක් ලෙස ගොඩ නංවා තිබුණු විමුක්ති කොටි සංවිධානයෙහි මා ක්‍රියාත්මක වූ කාලය එහි ඉතාමත් උච්ඡස්ථානයට පැමිණ තිබූ කාලය විය. සංවිධානයේ ක්‍රියාකාරකම්වලත්, තීරණවලත් හරි වැරදි හඳුනා ගැනීමට හෝ නැතහොත් ඒවා නිවැරදි කර අපේ ස්ථාවරය වෙනස් කර ගැනීමට හෝ සංවිධානය තුළ සිහිනෙන්වත් සිතීමට ඉඩක් නොවීය. එමෙන්ම අපේ සටන්කාමීහු කිසිම පැනයක් නොඅසා දිනපතා සටන් පෙරමුණෙහි දිවි පුදමින් උන්හ. එම දිවි කැපකිරීම් ඉදිරියේ වෙනත් කිසිම දෙයකින් නැඟී සිටිය නොහැකි තත්ත්වයක් විය. 'වීර මරණය' වැළඳ ගන්නා තෙක් විමුක්ති ව්‍යාපාරයෙහි විශ්වසනීය සටන්කාමියෙකු ලෙස සේවය කළ යුතුය යන්න හැර මගේ චිත්තයෙහි වෙනස් කිසිම දෙයක් දෘෂ්‍යමාන නොවීය. කාල ප්‍රවාහය සියලු වළ ගොඩැලි පුරවමින් වේගයෙන් ගලා යමින් තිබිණ.

**මතු සම්බන්ධයි**




**33 වන පිටෙන්**

හදන එක කැතම වැඩක්" ඔහු කීවේ ස්නේහා ළඟටම පැමිණය. කිසිවෙකුට ඇසේ යයි බියෙන් වගේ ය.

ස්නේහා කිසිවක් නොකියා අසා සිටියා ය. ඇගේ ඇස්වල කඳුලක් මතුව එන හැටි තරුණ දොස්තරවරයා දුටුවේ ය.

"කණගාටුවෙන්න එපා ස්නේහා.. ඔයාට මේ හොස්පිට්ල් එකේ රස්සාව දුන්නැත්තං මං වෙන හොස්පිට්ල් එකක රස්සාව අරගෙන දෙන්නම්.. ඒ ගැන සැකයක් තියාගන්න එපා.." ඔහු කීවේ ය. "... දක්ෂ නර්ස් කෙනෙක් ගන්න අකමැතිවෙන හොස්පිට්ල්




එකක් තියෙනව කියල මං හිත්නනෙ නෑ"

මේනක කියන්නේ තමා ගැන ඇති අනුකම්පාවෙන් බව ස්නේහා දනියි. එවැනි

**පන්සල ඉදිරියේ මහපාරේ නැවතුණ ඈ දෑත් එක්කොට ඈතින් පෙනෙන බෝ ගසට වැන්දා ය. දන්නා දා සිට පන්සල පසු කර යන විට කළ මේ වන්දනාව දැන් පුරුද්දක් වී ඇත. පන්සලේ මහ ගේට්ටුව අසළ පොඩි හාමුදුරුවන් සමග කතාවක සිටි ඉසුර ස්නේහා දැක්කේ ඈ ආපසු හැරෙන විට ය. ඔහු ඇය වෙත ආවේ සිනාසී ගත්වනම ය.**

අනුකම්පාවක අවශ්‍යතාවක් නැතැයි ඇයට සිතෙයි. අවශ්‍යව ඇත්තේ මේ සියල්ලෙන් මිදී පලායාමටය. ගමට ගොස් නිවී සැනසිල්ලේ ජීවත් වෙන්නට ලැබේ නම් එය මේ කොළඹ තොවිලයට වඩා සැප ය.

"මට දැං මේ ඔක්කොම එපා වෙලා තියෙන්නෙ සර්.. මං ගෙදර යනවා.. ආයෙ කොළඹ පැත්ත පළාතට එන්න හිතන්නෙ නෑ.. ගමට වෙලා මගේ වැඩක් බලාගෙන ඉන්න එක මෙයිට වඩා දාහෙන් සම්පතයි" ස්නේහා කීවේ හිතේ වේදනාවටම ය.

"පිස්සු නටන්න එපා ස්නේහා.. මේ වගේ කරදරද මිනිස්සුන්ට වෙන්නෙ? හිතට ශක්තිය ගන්න.. අපි ඉන්නවනෙ ඔයා ළඟම.." දොස්තර මේනක "අපි" කියා කීවේ "මම" කියා කියන්නට බැරි කමට ය.

"අපි සල්ලිකාරයො නෙවෙයි තමයි.. ඒත් අපි ගමේ ඉන්දැද්දි කාල බීල සතුටින් හිටියා.. වෙන කරදරයක් තිබ්බෙත් නැහැ.. එහෙම ජීවත්වෙන එක සැපයි සර්..." ස්නේහා කියන්නේ බිඳුණ හඬින් ය.

"මට තේරෙනව ඔයාගෙ හිතේ තියෙන කළකිරීම.. දැං ඕක ගැන හිතන්න එපා.. ගෙදර යන්න... මං ඔයාව කන්ටැක්ට් කරන්නං.." ඔහු කියයි. මේනක වැනි රටේ පිළිගත් තරුණ වෛද්‍යවරයකු තමා ගැන දක්වන මේ කරුණාව එක අතකින් පුදුමයට කාරණයකි. මේ ඔහුගේ නිහතමානීකම විය යුතු ය. ඔහු ආඩම්බරකාර දොස්තර කෙනෙක් යයි සිතා සිටි කාලයක් ස්නේහාට විය. ඒ ආඩම්බරකම් ටිකක් දැන අඳුනාගන්නාතෙක් පමණකි.

"මං ගැන මෙහෙම හරි හිතනවට සර්ට පින්.." ස්නේහා මිමිණුවා ය.

"ඒකත් නරකම නැහැ" ඔහු සිනාසුණේ ය.

"මොනාද නරක නැත්තෙ?" ස්නේහා ඇසුවා ය

"පින්" ඔහු කීවේ ඇය වෙතින් ඈත්ව යන අතරදී ය. කොරිඩෝවේ ඈතට ඇවිද යන ඔහු දෙස මද වේලාවක් බලා සිටි ස්නේහා ප්‍රධාන දොරටුව වෙත යන්නට හැරුණා ය. සමහරවිට මේ ගොඩනැගිල්ලේ මේ ප්‍රධාන දොරටුව හරහා යන අවසාන දවස අද විය හැකියයි ඇය ඒ අතරම සිතුවා ය. හැම දෙයක්ම සිදුවන්නේ හිතන්නටවත් නොහැකි තරම් වේගයකිනි.

0000

ස්නේහා බෝගහවත්ත පාර අසළින් බසයෙන් බසින විට සවස හතරත් පසුවී තිබුණි. බස් නැවතුමේ සිටි දන්නා හඳුණන අයට සිනාවකින් සංග්‍රහ කරමින්ම ඈ අඩියෙන් දෙකන් ගුරු පාරට අවතීර්ණ වූවා ය. ඇයට කරේ එල්ලාගෙන සිටින ගමන් මල්ල වෙනදාට වඩා බරට දැනුණි. තමා මේ කඩිමුඩියේ ගමට ආවේ ඇයිදැයි අප්පච්චි අසන විට දිය හැකි පිළිතුර කුමක්දැයි ඇයට සිතා ගත නොහැකිය. මේ සිදුවුණ අලකලංචි ඔහුගේ ඔලුවට දමන්නට ඇයට නොසිතෙයි. තියෙන ප්‍රශ්න මදිවාට ඔහුගේ ඔලුවට මේ බරත් දැමිය නොහැකි ය. නිවාඩුවකට ආවා සේ අඟවා කරබාගෙන සිටීම සුදුසු යයි අවසානයේ ඈ සිතුවා ය.

පන්සල ඉදිරියේ මහපාරේ නැවතුණ ඈ දෑත් එක්කොට ඈතින් පෙනෙන බෝ ගසට වැන්දා ය. දන්නා දා සිට පන්සල පසු කර යන විට කළ මේ වන්දනාව දැන් පුරුද්දක් වී ඇත. පන්සලේ මහ ගේට්ටුව අසළ පොඩි හාමුදුරුවන් සමග කතාවක සිටි ඉසුර ස්නේහා දැක්කේ ඈ ආපසු හැරෙන විට ය. ඔහු ඇය වෙත ආවේ සිනාසී ගත්වනම ය.

"නංගි කොළඹ ඉඳන් එන ගමන් ද?" ඔහු ඇසුවේ ඇගේ කරේ වූ ගමන් මල්ල ගන්නට අත දිග කරන ගමන් ය. ස්නේහා පිළිතුරක් නොදී සිනාසුණා ය. එනමුදු ඔහු ගමන් මල්ල අතට ගනිද්දී විරුද්ධත්වයක් නොපෑවා ය.

"හදිස්සියෙම ?" ඔහු නැවත ඇසුවේ පළමු ප්‍රශ්නයට ඇගෙන් පිළිතුරක් නෙලැබුණ විට ය.

"හදිසියක් නෑ ඉසුරයියා.. නිවාඩු ලැබුණා.. ඉතින් කොළඹට වෙලා ඉන්න බැරි නිසා ගමේ ආවා.." ඈ කීවේ තමා හා එක පෙළට ගමන් කරමින් සිටින ඉසුරගේ මුහුණ දෙස බලමින් ය. ".. අද පන්සලේ වැඩක්ද?" අනතුරුව ඈ ඇසුවා ය.

"වැඩක්මත් නෙවෙයි.. මේ පාර ශිෂ්‍යත්වෙ කරන පොඩ්ඩන්ට උපකාරක පන්තියක් කරමු කියලා පොඩි හාමුදුරුවො යෝජනාවක් ගෙනල්ල.. ඒක ගැන පොඩ්ඩක් කතා කරන්න කියලා ආවා.." ඔහු කීවේ ය.

"තාමත් සමාජ සේවෙ කර කර ඉන්නවා මිසක් තමන් ගැන හිතන්න පටන් ගත්තෙ නෑ නේද?"

**මතු සම්බන්ධයි**